ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

**ප්‍රසම්පාදන අංකය S/364/26**



# දියත උයන පරිශ්‍රයේ ආහාරපාන වෙළඳ කුටි අංක 12 (South Indian & Vegetarian Food Corner) මාසික කුලී පදනම මත පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම

REAL

**ලංසු කැඳවීම අවසන් කිරීම**

**දිනය : 2026.08.18**

**වේලාව : ප.ව.01.30**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සැපයුම්)
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය
දුරකථන : 011-2866832

# මාර්ග සිතියම සහ ස්ථාන සිතියම

## ස්ථානය - දියත උයන




**ලංසු පත්‍රිකාව සමඟ ලබාදිය යුතුම වන අත්‍යාවශ්‍යම ලිපිගොනු පරික්ෂාව**

- 11 පිටුවෙහි සඳහන් නිවැරදිව සම්පූර්ණ කර සහ අත්සන් කරන ලද ප්‍රමාණ බිල්පත්‍රය ☐
- 12 හෝ 13 පිටුවෙහි සඳහන් නිවැරදිව සම්පූර්ණ කර සහ සහතික කරන ලද දුස්සන්ධානීය නොවීම සහ බහු ලංසු/යෝජනා ඉදිරිපත් නොකිරීම සම්බන්ධ දිවුරුම් ප්‍රකාශය (Non-collusion Affidivit) ☐
- පිටු අංක 03 හි සඳහන් 3.5 වගන්තියෙහි සඳහන් ලංසු ඇපකරයෙහි මුල් පිටපත ☐
- ආහාරපාන සැකසීම සහ අලෙවිය සම්බන්ධයෙන් වූ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය (පුද්ගලික සමාගමක් නම්, ව්‍යාපාරයේ ස්වභාවය තහවුරු කිරීමේ සහතිකයක්) ☐
- පුද්ගලික සමාගමක් වශයෙන් ලියාපදිංචි කර ඇති ව්‍යාපාරයක් නම්, ආකෘති අංක 18 සහ 20 ☐

## 1.0 හැඳින්වීම

සභාපති, ප්‍රසම්පාදන කමිටුව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (මින් පසුව "සංස්ථාව" ලෙස හඳුන්වනු ලැබේ) විසින් දියත උයන පිහිටි ආහාරපාන වෙළඳ කුටි අංක 12 (South Indian & Vegetarian Food Corner) මාසික කුලී පදනම මත වසර 03 ක් සඳහා වාර්ෂිකව අලුත් කරනු ලබන ගිවිසුමක් යටතේ පවත්වාගෙන යාම සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් ලංසු කැඳවනු ලබයි.

එලෙස සංස්ථාව විසින් තෝරාගත් ලංසුකරුගේ කාර්ය සාධනය පදනම් කර ගනිමින් සහ වසරක කාලයක් සම්පූර්ණ කල පසු ඉදිරි වර්ෂය සඳහා ගිවිසුම දීර්ඝ කරන අවස්ථාවකදී, මාසික කුලිය ගණනයේදී, වර්තමාන වර්ෂය සඳහා ගෙවන මාසික කුලියට 10% ක් එකතු කරනු ලැබේ.

## 2.0 ලංසුකරුවන් සඳහා උපදෙස්

2.1 අංක 1.0 සිට අංක 7.0 දක්වා වන ඡේද හොඳින් කියවා බලා අවබෝධ කරගෙන නව ලංසු ඉදිරිපත් කරන ලෙස ලංසුකරුවන්ට උපදෙස් ලබාදේ.

2.2 ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියාපටිපාටිය (National Competitive Bidding -NCB) හරහා ලංසු පත්‍රිකා ඉදිරිපත් කරනු ලැබේ.

2.3 ලංසු පත්‍රිකාව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැපයුම්) වෙතින් 2026/08/03 දින සිට 2026/08/17 දින දක්වා සඳුදා සිට සිකුරාදා දක්වා රජයේ නිවාඩු දින නොවන වැඩකරන දින වලදී පෙ.ව.09.00 සිට ප.ව.03.00 දක්වා ආපසු නොගෙවන **රු.5,000.00** ගෙවා මිලදී ගත හැක.

2.4 වැඩිදුර විස්තර ලබාගැනීම සඳහා

සැලසුම් හා ව්‍යාපාර සංවර්ධන අංශය
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ,
රාජගිරිය
දුරකථන :- 011-2871167, 011-2861170, 071-3665151

2.5 මිල ගණන් ඉදිරිපත් කිරීමට නියමිත කාල සීමාවට ප්‍රථම ඕනෑම අවස්ථාවක ලිඛිතව හෝ ඊමේල්/ ෆැක්ස් මාර්ගයෙන් අතිරේක ලේඛනයක් නිකුත් කිරීම මගින් ලංසු පත්‍රිකාව සංශෝධනය කිරීමට සංස්ථාවට හැකියාව පවතී.

2.6 සෑම ලංසුකරුවෙක්ම තම ලංසුව ඉදිරිපත් කිරීමට ප්‍රථම අදාල වෙළඳ කුටිය පිහිටා ඇති ස්ථානය සහ ඒ අවට පරීක්ෂා කිරීම සඳහා උපදෙස් ලබා දෙන අතර එසේ පරීක්ෂා කිරීම සඳහා අදාල ස්ථානයට පැමිණීමේ පිරිවැය ලංසුකරු විසින් දැරිය යුතුවේ.

2.7 සෑම ලංසුකරුවෙක්ම තම ලංසුව පිළියෙල කිරීම සඳහා දරණ පිරිවැය තමන් විසින්ම දැරිය යුතු අතර මෙම සංස්ථාව එවැනි කිසිදු ආකාරයේ පිරිවැයක් දැරීමට යටත් නොවන අතර, ලංසුකරු දරණ පිරිවැය නැවත ගෙවීමක්ද සිදු නොකරයි.

## 3.0 ලංසු පත්‍රිකා පිළියෙල කිරීම

3.1 ලංසුකරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ලංසු පත්‍රිකාවේ ප්‍රමාණ බිල්පත්‍රය (11 පිටුවේ සඳහන්) තම අත් අකුරින් පිරවිය යුතුය. සියළුම කරුණු පැහැදිලිව සම්පූර්ණ කල යුතුය.

3.2 ලංසුව සමඟ සඳහා පහත ලිපි ලේඛන සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.

I. 11 පිටුවෙහි සඳහන් නිවැරදිව සම්පූර්ණ කර සහ අත්සන් කරන ලද ප්‍රමාණ බිල්පත්‍රය

II. 12 හෝ 13 පිටුවෙහි සඳහන් නිවැරදිව සම්පූර්ණ කර සහ සහතික කරන ලද දුස්සන්ධානීය නොවීම සහ බහු ලංසු/යෝජනා ඉදිරිපත් නොකිරීම සම්බන්ධ දිවුරුම් ප්‍රකාශය (Non-collusion Affidivit)

III. පිටු අංක 03 හි සඳහන් 3.5 වගන්තියෙහි සඳහන් ලංසු ඇපකරයෙහි මුල් පිටපත

READ ONLY

IV. ආහාරපාන සැකසීම සහ අලෙවිය සම්බන්ධයෙන් වූ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය (පුද්ගලික සමාගමක් නම්, ව්‍යාපාරයේ ස්වභාවය තහවුරු කිරීමේ සහතිකයක්)

V. පුද්ගලික සමාගමක් වශයෙන් ලියාපදිංචි කර ඇති ව්‍යාපාරයක් නම්, ආකෘති අංක 18 සහ 20

ඉහත සඳහන් ලේඛන අත්‍යාවශ්‍ය ලේඛන වන අතර, එම ලේඛන ලංසුව සමඟ ඉදිරිපත් නොකළහොත්, විශාල බැහැරවීමක් (Major Deviation) ලෙස සලකන අතර, ලංසුව ඇගයීමට භාජනය නොකොට ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.3 ඊට අමතරව ලංසුකරුවන් විසින් ලංසු ඇගයීම සඳහා කොන්දේසි අංක 5.6 (b) හි සඳහන් අවශ්‍ය ලිපිලේඛන සහ ලංසුකරුගේ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුයි

3.4 <u>ලංසුවෙහි වලංගුභාවය</u>

ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලංසු 2026/11/17 දින දක්වා වලංගු වන අතර, අවශ්‍ය වන අවස්ථාවකදී ලංසුවේ වලංගු කාල සීමාව දීර්ඝ කිරීමට සංස්ථාවට බලය තිබේ.

3.5 <u>ලංසු ඇපකරය</u>

සියළුම ලංසුකරුවන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත වාණිජ බැංකුවකින් ලබාගත් රු.100,000.00 ක ලංසු ඇපකරයක් ලංසු පත්‍රිකාව සමග ලබාදිය යුතු අතර, ලංසු ඇපකරය 2026/12/15 දක්වා වලංගු විය යුතුය. (ආදර්ශ ආකෘතිය ඇමුණුම 02 දක්වා ඇත).

ලංසුකරු විසින් මුදලින් ඇපකර ඉදිරිපත් කරන්නේ නම් (චෙක්පත් සහ වෙනත් ආකාරයක ගෙවීම් ක්‍රම හැර) සංස්ථාවෙහි මුදල් අංශය වෙත ගෙවීම් සිදුකර ලබාගත් <u>ලදුපතෙහි මුල් පිටපත ඉදිරිපත් කරන ලංසු පත්‍රිකාව සමඟ ඇමිණිය යුතුය.</u>

චෙක්පත් හෝ වෙනත් ගෙවීම් භාරගනු නොලැබේ.

3.6 ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් පවත්වන පෙර ලංසු රැස්වීම 2026/08/10 දින පෙ.ව.10.00 ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවෙහි සැලසුම් හා ව්‍යාපාර සංවර්ධන අංශයේදී පැවැත්වේ. ඒ වනවිට ලංසු පත්‍රිකා මිලදීගෙන ඇති අයට පමණක් එම රැස්වීම සඳහා සහභාගි විය හැකිය. එහිදී ලංසුකරුට/ලංසුකරුවන්ට යම් ගැටළුවක් වේ නම් එම ගැටළුව රැස්වීම පැවැත්වීමට නියමිත දිනට පෙර ලිඛිතව හෝ විද්‍යුත් තැපෑල මගින් ඉදිරිපත් කළ යුතුය.

3.7 තෝරාගත් ලංසුකරුට පහත සඳහන් ආහාරපාන වර්ග **<u>පමණක්</u>** විකිණීම සඳහා අවසර ලබාදේ

| **වෙළඳ කුටි අංකය** | **වෙළඳ කුටියේ නම** | **අවසරලත් ආහාර/පාන අයිතම වර්ග** | **අවම මාසික කුලිය** |
|---|---|---|---|
| 12 | South Indian & vegetarian food Corner | තෝසේ වර්ග, ඉඩ්ලි, පූරි, වඩේ, චපාති ආදිය සහ දකුණු ඉන්දියානු ව්‍යාංජන වර්ග හා නිර්මාංශ (ඉන්දියන්) ආහාර වර්ග | රු.206,500.00 + VAT |



READ ONLY

3.8 දියත උයන පරිශ්‍රයෙහි පවතින අනෙකුත් වෙළඳ කුටිවල විකිණීම සඳහා අවසර ලබා දී ඇති ආහාරපාන වර්ග පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| **වෙළඳ කුටි අංකය** | **වෙළඳ කුටියේ නම** | **අවසරලත් ආහාර/පාන අයිතම වර්ග** |
|---|---|---|
| 01 – I | Corn & Traditional porridge corner | කොළ කැඳ, සුප් වර්ග, ඔසුපැන් වර්ග සහ විවිධ රසයෙන් යුත් බඩ ඉරිඟු වර්ග |
| 01 – II | Traditional Sweets, Tea & Coffee corner | ශ්‍රී ලාංකික රසකැවිලි, විවිධ රසයෙන් යුතු තේ වර්ග (ශීතකළ හා ශීතනොකළ), විවිධ රසයෙන් යුතු කෝපි වර්ග (ශීතකළ හා ශීතනොකළ) හා පොප් කෝන් |
| 02 | Fruit Juice Corner | නැවුම් පළතුරු බීම වර්ග, ෆලූඩා වර්ග, ස්මූති වර්ග සහ පළතුරු සලාද (අයිස් ක්‍රීම් පමණක් අලෙවිය සිදු කළ නොහැක) |
| 03 | Sri Lankan Food Corner | කිරිබත, කුරක්කන් රොටි, කුරක්කන් පිට්ටු, කඩල, කව්පි, මුං ඇට, දේශීය අල වර්ග (බතල, මඤ්ඤොක්කා) ශ්‍රී ලාංකික බත් සහ ව්‍යාංජන |
| 04 | Chicken Burger Corner | බැදපු කුකුළ් මස් (Fried Chicken), කුකුළ් මස් වර්ග යෙදු බර්ගර්, හොට්ඩෝග්, සබ්මැරීන් වර්ග සහ සැන්විච්ස් වර්ග |
| 05 | Snack Corner | සියළුම කේක් වර්ග, රොල්ස්, පැටිස්, කට්ලට්, පේස්ට්‍රි, බනිස් වර්ග, සැන්විච්ස් වර්ග, ඩොනට්ස් සහ හොට් ඩොග් වර්ග |
| 06 | Dairy Food & Dairy Drinks & Sea Food Corner | කිරි ආශ්‍රිත ආහාර හා කිරි ආශ්‍රිත බීම වර්ග (ශීතකළ සහ ශීත නොකළ) සහ මාළු, ඉස්සෝ, දැල්ලෝ සහ සියළුම වර්ගයේ මුහුදු ආහාර (Sea food) යෙදු බනිස් වර්ග හා සැන්විච්ස් වර්ග |
| 07 | Soft Drinks & Ice Cream Corner | කාබනීකෘත බීම වර්ග (Carbonated Drinks), අයිස් ක්‍රීම්, Waffle හා අයිස්ක්‍රීම් කොත්තු |
| 08 | Hot & Spicy Food Corner | ආප්ප, ඉඳිආප්ප, කොත්තු වර්ග, රොටි සමග ව්‍යාංජන වර්ග, එළවළු රොටි සහ බිත්තර රොටි |
| 09 | Fried Rice, Mongolian, Arabic, Malaysian Rice Corner | ෆ්‍රයිඩ් රයිස් වර්ග, නාසිගුරම්, මෝංගලියන් රයිස්, ආරාබි සහ මැලේසියානු රයිස් වර්ග |
| 10 | Italian Food Corner | ඉතාලි කෑම වර්ග, පාස්තා, නූඩ්ලස්, ලසාඤ්ඤා (Lasagna), ස්පැගටි (Spaghetti) සහ පීසා වර්ග |
| 11 | North Indian food Corner | උතුරු ඉන්දියානු ආහාර වර්ග (බුරියානි, නාන්, පරාටා, ෂවර්මා, කෙබාබ්ස්, විවිධ වර්ගයේ උතුරු ඉන්දියානු ව්‍යංජන) සහ සියළුම තායි ආහාර වර්ග |

3.9 ඉහත 3.8 හි සඳහන් පරිදි, අනෙකුත් වෙළඳ කුටිවල විකිණීම සඳහා අවසර ලබා දී ඇති ආහාරපාන වර්ග, ලංසු ඉදිරිපත් කරන 3.7 හි සඳහන් වෙළඳ කුටි වල විකිණීම සඳහා අවසර නොමැත. විකිණීමට හැකි ආහාර වර්ග සම්බන්ධව ඇතිවන ඕනෑම ගැටළුවකදී / මත විමසුමකදී සංස්ථාවේ තීරණය අවසාන තීරණය වනු ඇත.

3.10 ව්‍යාපාරික කටයුතු සිදු කරගෙන යෑම සඳහා අවශ්‍ය මූලික උපකරණ කිසිවක් සංස්ථාව විසින් ලබා නොදේ. එකී සියළුම උපාංග තෝරාගත් ලංසුකරු ඔහුගේ වියදමින් සපයා ගත යුතුය. එම භාණ්ඩ සඳහා පිරිවැය තෝරාගත් ටෙන්ඩර්කරු විසින් දැරිය යුතුය.

3.11 <u>**අවම මාසික කුලිය**</u>

වෙළඳ කුටි සඳහා අදාළ අවම මාසික කුලිය ඉහත 3.7 වගුවෙහි සදහන් පරිදි වන අතර, එම මාසික කුලිය සඳහා අදාල බදු එකතු විය යුතුය. (එකතු කළ අගය මත බද්ද). <u>එම අවම මාසික කුලියට වඩා අඩුවෙන් තබා ඇති ලංසු ප්‍රතික්ෂේප වනු ඇත .</u>

READ ONLY

3.12 **<u>මාසික නඩත්තු ගාස්තුව</u>**

පිටු අංක 11හි ලංසුකරු විසින් සඳහන් කර ඇති **මාසික කුලී මුදලට අමතරව**, තෝරාගත් ලංසුකරු විසින් එක් වෙළඳ කුටියක් සඳහා **මාසික නඩත්තු ගාස්තුව වන රු.50,000.00** ක මුදල ගෙවිය යුතුය. මෙම නඩත්තු ගාස්තුව සංස්ථාව විසින් වාර්ෂිකව සමාලෝචනය කරනු ලබන අතර එය සංශෝධන වලට යටත් වේ.

3.13 **<u>ජල සහ විදුලි ගාස්තුව</u>**

එක් එක් වෙළඳ කුටිය සඳහා වෙන වෙනම විදුලි මීටර සවිකර ඇති අතර, වෙළඳ කුටියෙහි මාසික පරිභෝජනය පදනම් කර ගනිමින් ජල හා විදුලි බිල්පත් ගාස්තු සංස්ථාව මගින් සකසනු ලැබේ. තෝරාගත් ලංසුකරු විසින් තම වෙළඳ කුටියට අදාලව සංස්ථාව විසින් ලංසුකරු වෙත යොමු කරනු ලබන ජල හා විදුලි බිල්පත් ගාස්තු, මාසික වෙළඳ කුටි ගාස්තු සමඟ ගෙවිය යුතුය.

## 4.0 <u>ලංසු ඉදිරිපත් කිරීම</u>

4.1 ලංසුකරුවන් තම ලංසුව මුද්‍රා තබන ලද ලියුම් කවරයක් තුල ඉදිරිපත් කල යුතුය.

4.2 ලංසු ඇපකරය මුදලින් ගෙවීම සිදුකරයි නම් එම රිසිට්පත හෝ බැංකු ඇපකරයෙහි **<u>මුල්</u>** **<u>පිටපත</u>** ලංසු පත්‍රය සමඟ අමුණා තිබිය යුතුය.

4.3 ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරෙහි "**ප්‍රසම්පාදන අංක S/364/26**" සහ "**දියත උයන පරිශ්‍රයේ ආහාරපාන වෙළඳ කුටි මාසික කුලී පදනම මත පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම**" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

4.4 ලංසුව බහා ඇති ලියුම් කවරයේ පහත ලිපිනය සඳහන් කළ යුතුය.

**සභාපති - ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,**
**නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,**
**වැලිකඩ, රාජගිරිය**

සියළුම ලංසු ඉහත ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවීම <u>හෝ</u> පහත ලිපිනයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

**සැපයුම් අංශය,**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,**
**නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,**
**වැලිකඩ, රාජගිරිය**

4.5 ලංසු පත්‍රිකා භාරගැනීම 2026/08/18 දින ප.ව.01.30 ට අවසන් වීමට නියමිත වන අතර එම වේලාව ඉක්මවූ වහාම සියළුම ලංසු විවෘත කරනු ලැබේ. සංස්ථාවේ අභිමතය පරිදි අවශ්‍ය නම් අදාල දිනය දීර්ඝ කළ හැක.

4.6 ලංසු ඉදිරිපත් කිරීම සඳහා සපයා ඇති අවසන් දිනට සහ වේලාවට පසුව ඉදිරිපත් වන සියළුම ලංසු ප්‍රතික්ෂේප වන අතර, එම ලංසු විවෘත නොකර අදාල ලංසුකරු වෙත ආපසු යවනු ලැබේ.

4.7 ලංසු විවෘත කිරීමට ප්‍රථම තමාගේ ලංසුව ඉවත් කරගැනීමට කිසියම් ලංසුකරුවෙකුට අවශ්‍ය වේ නම්, ලංසුව විවෘත කිරීමේ දිනට ප්‍රථම ඒ බව ප්‍රසම්පාදන කමිටු සභාපති වෙත ලිඛිතව දැන්විය යුතුයි.

එනමුත්, ලංසුව විවෘත කිරීමෙන් අනතුරුව ලංසු වලංගු කාල සීමාව තුළ කිසියම් ලංසුකරුවෙකු විසින් තම ලංසුව ඉවත් කර ගන්නේ නම්, 3.5 හි සඳහන් අදාල ලංසු ඇපකරය සංස්ථාව සන්තක වේ.

4.8 ලංසු ඉදිරිපත් කිරීමේදී අදාල වෙළඳ කුටියෙහි අංකය හා වෙළඳ කුටි නාමය පැහැදිලිව සඳහන් කළ යුතුය. එක් ලංසු පත්‍රිකාවක් තුළ වෙළඳ කුටි අංක දෙකක් හෝ ඊට වඩා ඉදිරිපත් කිරීම ලංසුව අවලංගු වීමට හේතුවේ. තවද, වෙළඳ කුටි අංකය හා වෙළඳ කුටි නාමය අතර වෙනසක් වේ නම්, වෙළඳ කුටි නාමයට ප්‍රමුඛතාවය ලබාදී, ලංසුව ඉදිරිපත් කර ඇත්තේ එම වෙළඳ කුටියට යැයි සලකනු ලැබේ.

READ ONLY

5.0 **<u>ලංසු විවෘත කිරීම සහ ඇගයීම</u>**

5.1 ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලබාදී තිබූ අවසන් දින එම වේලාව ඉක්මවූ වහාම සියළුම ලංසු විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට පැමිණ සිටින ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් පැමිණීමේ ලේඛණය අත්සන් කිරීම මගින් ඔවුන්ගේ පැමිණීම තහවුරු කළ හැක.

5.2 ලංසුකරුගේ නම, ඉදිරිපත් කර ඇති මාසික කුලී අගය, ඉල්ලා ඇති වෙළඳ කුටි අංකය, ලංසු ඇපකරය සහ අවශ්‍ය අනෙකුත් තොරතුරු එම අවස්ථාවේදී ප්‍රකාශ කරනු ඇත.

5.3 මාසික කුලී මුදල ප්‍රමාණ බිල්පතෙහි අකුරෙන් සහ ඉලක්කමෙන් ලිවීම අනිවාර්යය වන අතර, ඕනෑම ගැටළු සහගත තත්ත්වයකදී අකුරින් සඳහන් අගය බලපවත්වන්නේය.

5.4 ලංසුකරු ඉදිරිපත් කර ඇති ව්‍යාපාර ලියාපදිංචි සහතිකය ආහාරපාන සැපයීම, අලෙවිය හා සම්බන්ධ සහතිකයක් නොවන්නේනම් මූලික ලංසු ඇගයීමේදීම එම ලංසුව අවලංගු වනු ඇත.

5.5 ලංසුකරුවන් විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් පරීක්ෂා කිරීම ලංසු සැසඳීම හා ඇගයීම සම්බන්ධ තොරතුරු පැහැදිලි කිරීම, කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා ඉදිරිපත් කර නිර්දේශ යනාදිය ලංසුකරු වෙත අනාවරණය නොකරනු ඇත. ලංසු කැඳවීම හා ඒ සම්බන්ධ තීරණ ගැනීමේ සංස්ථාවේ ක්‍රියාවලියට බලපෑම් කිරීම සඳහා ලංසුකරු විසින් දරණ ඕනෑම ප්‍රයත්නයක්, එම ලංසුකරු විසින් ලබාදී ඇති ලංසුව ප්‍රතික්ෂේප වීමට හේතු වේ.

5.6 ලංසු ඇගයීමේදී ලකුණු ලබාදීමේ පටිපාටිය පහත පරිදි වේ.

(a) <u>මූලික ඇගයීම</u>

I. 11 පිටුවෙහි සඳහන් නිවැරදිව සම්පූර්ණ කර සහ අත්සන් කරන ලද ප්‍රමාණ බිල්පත්‍රය

II. 12 හෝ 13 පිටුවෙහි සඳහන් නිවැරදිව සම්පූර්ණ කර සහ සහතික කරන ලද දුස්සන්ධානීය නොවීම සහ බහු ලංසු/යෝජනා ඉදිරිපත් නොකිරීම සම්බන්ධ දිවුරුම් ප්‍රකාශය (Non-collusion Affidivit)

III. පිටු අංක 03 හි සඳහන් 3.5 වගන්තියෙහි සඳහන් ලංසු ඇපකරයෙහි මුල් පිටපත

IV. ආහාරපාන සැකසීම සහ අලෙවිය සම්බන්ධයෙන් වූ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය (පුද්ගලික සමාගමක් නම්, ව්‍යාපාරයේ ස්වභාවය තහවුරු කිරීමේ සහතිකයක්)

V. පුද්ගලික සමාගමක් වශයෙන් ලියාපදිංචි කර ඇති ව්‍යාපාරයක් නම්, අකෘති අංක 18 සහ 20

සැ.යු. - ඉහත ලිපි ලේඛන වලින් යම් කිසි ලේඛනයක් නොමැති නම් එම ලංසුව මූලික ඇගයීමේදීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

READ ONLY

(b) <u>ද්විතීක ඇගයීම</u>

| විස්තරය | අවශ්‍ය ලිපි ලේඛන | බරතැබීමේ ලකුණු | උපරිම ලකුණු සංඛ්‍යාව |
|---|---|---|---|
| ආසන්න වසර 05 ඇතුළත ආහාරපාන වෙළඳ කුටියක් පවත්වාගෙන යාමේ පළපුරුද්ද | a) ආසන්න වසර 05 ක් ඇතුළත ලංසුකරු විසින් ආහාරපාන වෙළඳ කුටියක් පවත්වාගෙන යාම<br>- ආසන්න වසර 05 ක කාලයක් තුළ ආහාරපාන වෙළඳ කුටියක් පවත්වාගෙන ගිය බවට ග්‍රාම නිළධාරීවරයාගේ/ සේවායෝජකයාගේ සහතිකය (අදාළ කාලපරිච්ජේදය සඳහන් කළ යුතුය)<br>**සහ**<br>- වෙළඳ කුටි වල ඡායාරූප (ස්ථාන වෙන වෙනම දක්වමින්)<br>**සහ**<br>- ලංසුකරුගේ ලංසුව ඉදිරිපත් කරන වෙළඳ කුටියේ නමින් පවතින බැංකු ප්‍රකාශන (අදාල කාලපරිච්ජේදය සඳහා) | • සම්පූර්ණ කරන ලද වර්ෂ 01 ට ලකුණු 20 බැගින් උපරිම ලකුණු 100 | 100 |

**<u>අඩු කිරීම්</u>**

| විස්තරය | අඩුවන ලකුණු විස්තරය |
|---|---|
| දියත උයන ආහාරපාන වෙළඳ කුටි සඳහා ලංසු ඉදිරිපත් කිරීම<br><br>S/265/25 යන ප්‍රසම්පාදනය සඳහා | • ලංසු විවෘත කර ඇගයීම් සිදු කරන අතරතුර ඉවත් වූ ලංසුකරුවන්ගෙන් ලකුණු 25 බැගින් අඩු කරනු ලැබේ.<br>• ව්‍යාපාර ප්‍රදානය කිරීමේ ලිපිය ලබාදීමෙන් පසුව ඉවත් වූ ලංසුකරුවන්ගෙන් ලකුණු 25 බැගින් අඩු කරනු ලැබේ.<br>• ව්‍යාපාර ප්‍රදානය පිළිගෙන මාස 03 කට අඩු කාලයක් ඇතුළතදී ඉවත් වූ ලංසුකරුවන්ගෙන් ලකුණු 15 බැගින් අඩු කරනු ලැබේ. |

සැ.යු. - මෙම ද්විතීක ඇගයීමේදී ලකුණු 50 (50%) හෝ ඊට වැඩි ලකුණු ලබාගන්නා ලංසුකරුවන්ගේ ලංසු පත්‍රිකා **<u>පමණක්</u>** සැලකිල්ලට ගනු ලැබේ.



READ ONLY

ද්විතික ඇගයීමෙන් ලකුණු 50 හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා එම වෙළඳ කුටියට අදාළ සියලුම ලංසු වලින් වැඩිම ලංසුව (මාසික කුලී අගය) සඳහන් ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනැමීමට කටයුතු කරනු ලැබේ.

## 6.0 ව්‍යාපාර ප්‍රදානය හා ව්‍යාපාර කටයුතු ආරම්භය

6.1 ඉදිරිපත් කර ඇති ලංසු වල වලංගු භාවය ඉකුත් වීමට ප්‍රථම සංස්ථාව විසින් තෝරාගත් ලංසුකරු වෙත ඔහුගේ ලංසුව පිළිගත් බව සඳහන් කරමින් "ව්‍යාපාරය ප්‍රදානය කිරීමේ ලිපිය" ලියාපදිංචි තැපැල් මගින් යොමු කරනු ඇත. සංස්ථාව සහ අදාල තෝරාගත් ලංසුකරු අතර විධිමත් ගිවිසුමක් අත්සන් කරන තුරු මෙම "ව්‍යාපාර ප්‍රදානය කිරීමේ ලිපිය" නිත්‍යානුකූල ලේඛනය හෙවත් ගිවිසුම ලෙස පිළිගනු ලබන්නේ ය.

6.2 "ව්‍යාපාර ප්‍රදානය කිරීමේ ලිපිය" ලැබීමෙන් දින 14 ක් ඇතුලත තෝරාගත් ලංසුකරු විසින් තම ව්‍යාපාර කටයුතු ආරම්භ කළ යුතු අතර, එසේ දින 14 ක් ඇතුලත ව්‍යාපාර කටයුතු ආරම්භ නොකළහොත්, මෙම ව්‍යාපාර කටයුතු හා සම්බන්ධව උනන්දුවක් නොමැති බව සලකා වෙනත් ලංසුකරුවෙකු තෝරා ගැනීම හෝ නැවත ලංසු කැඳවීමක් සිදු කිරීමට සංස්ථාව විසින් කටයුතු කරනු ලැබේ. එවිට ව්‍යාපාරය ආරම්භ කිරීමට අපොහොසත් වන තෝරාගත් ලංසුකරුගේ ලංසු ඇපකරය සංස්ථාව සතු වේ.

6.3 "ව්‍යාපාර ප්‍රදානය කිරීමේ ලිපිය" ලබා දීමට ප්‍රථම ලංසු කැඳවීමේ ක්‍රියාවලියෙහි ඕනෑම අවස්ථාවකදී ඕනෑම ලංසුවක් හෝ සියළුම ලංසු ප්‍රතික්ෂේප කිරීමට හෝ අදාල ලංසු ක්‍රියාවලිය අවලංගු කිරීමට සංස්ථාව සතුව බලය පවතින අතර එහිදී එම ක්‍රියාව පිළිබඳව විමසීමට ලංසුකරුවන්ට අයිතියක් නොමැත.

6.4 තෝරාගත් ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසුව හා තෝරාගත් ලංසුකරු 7.4 හි සඳහන් ආරක්ෂිත තැන්පතුව සංස්ථාව වෙත සිදු කළ පසු හෝ ලංසුවල වලංගු කාලය ඉකුත් වීමෙන් පසුව සියළු ලංසුකරුවන්ගේ ලංසු ඇපකර නිදහස් කරනු ලැබේ.

## 7.0 නියමයන් සහ කොන්දේසි

7.1 තෝරාගත් ලංසුකරුගේ කාර්ය සාධනය පදනම් කරගනිමින් උපරිමයට අවුරුදු තුනකට (03) යටත්ව අවුරුදු පතා අළුත්කරණ ගිවිසුමක් මගින් අදාල ආහාරපාන කුටිය කුලී පදනම මත තෝරාගත් ලංසුකරුට ලබාදෙනු ඇත.

7.2 එලෙස සංස්ථාව විසින් තෝරාගත් ලංසුකරුගේ කාර්ය සාධනය පදනම් කර ගනිමින් සහ වසරක කාලයක් සම්පූර්ණ කල පසු **ඉදිරි වර්ෂය** සඳහා ගිවිසුම දීර්ඝ කරන අතර, එහිදී මාසික කුලිය ගණනයේදී **වර්තමාන වර්ෂය සඳහා ගෙවන මාසික කුලියට 10% ක් එකතු කරනු ලැබේ**.

7.3 තෝරාගත් ලංසුකරු විසින් මාසික කුලී ගාස්තුවට අමතරව රජය විසින් අවස්ථානුකූලව පනවන බදු ගෙවිය යුතුය.

### 7.4 ආරක්ෂිත තැන්පතු

තෝරාගත් ලංසුකරු විසින් ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට පෙර තම ප්‍රථම මාසික කුලී වාරිකය සමග ප්‍රදානය කරනු ලැබූ වෙළඳ කුටියට අදාල පහත දැක්වෙන ආපසු ගෙවනු ලබන ආරක්ෂිත තැන්පතුව සිදුකළ යුතුය.

| වෙළඳ කුටි අංකය | වෙළඳ කුටියේ නම | ආරක්ෂිත තැන්පතුව (රු.) |
|---|---|---|
| 12 | South Indian & Vegetarian Food Corner | තෝරාගත් ලංසුකරු විසින් ප්‍රමාණ බිල්පතෙහි සඳහන් මාසික කුලිය මෙන් දෙගුණයක් ආරක්ෂිත තැන්පතුව වශයෙන් මුදලින් පමණක් සංස්ථා මුදල් අංශය වෙත ගෙවිය යුතුය. |

එම තැන්පත් මුදල නිදහස් කිරීම පහත සඳහන් කොන්දේසි වලට යටත්ව සිදුවේ.

i. තෝරාගත් ලංසුකරු විසින් ව්‍යාපාරය අඛණ්ඩව වසරක් පුරා පවත්වාගෙන යා යුතුය. එම වසර අවසානයේදී ව්‍යාපාරයෙන් ඉවත්ව යාමට අදහස් කරයි නම්, මාස දෙකකට (02) ප්‍රථම ඒ බව සංස්ථාව වෙත ලිඛිතව දැනුම් දී, අදාල වසර අවසානයේදී ව්‍යාපාරයෙන් ඉවත්ව යා හැකිය. එහිදී ව්‍යාපාරය පවත්වාගෙන යෑමේදී සංස්ථාවට අයවිය යුතු හිඟ

මාසික බදු මුදල්, ජල හා විදුලි බිල් පත්‍ර වේ නම්, ඒවා සහ වෙළඳ කුටියට අලාභයක් වී තිබේනම් එය සංස්ථාව විසින් තක්සේරු කර එම හානි මුදල, තැන්පත් මුදලින් අඩුකර ඉතිරි මුදල නිදහස් කරනු ඇත. එනමුත්, ඒ වන විට සංස්ථාවට ගෙවීමට ඇති මුළු මුදල තැන්පතු මුදල ඉක්මවන්නේ නම්, එම ඉක්මවන මුදල තෝරාගත් ලංසුකරු විසින් සංස්ථාවට ගෙවිය යුතුය.

ii. වසරකට වඩා අඩු කාලයකදී තෝරාගත් ලංසුකරු විසින් කුමන හෝ හේතුවක් මත අඛණ්ඩව දින 14 ක් තුළ ව්‍යාපාර කටයුතු සිදු නොකරන්නේ නම්, තෝරාගත් ලංසුකරු ව්‍යාපාරය හැරගියා සේ සැලකේ. එවිට තැන්පත් මුදල තෝරාගත් ලංසුකරු වෙත නිදහස් කිරීමක් සිදු නොවන අතර, එය සංස්ථාව සතු වේ. වෙළඳ කුටියට අලාභයක් වී තිබේනම් එය සංස්ථාව විසින් තක්සේරු කර එම හානි මුදල සමඟ ඒ වන විට හිඟව ඇති සියළුම මුදල් තෝරාගත් ලංසුකරු විසින් සංස්ථාවට ගෙවිය යුතුය.

iii. 7.5 හි සඳහන් ගෙවීම් කළයුතු නියමිත දින සිට දින 30 ට පසුවත් තෝරාගත් ලංසුකරු තවදුරටත් එම කුලී හා ගාස්තු ගෙවීමට අපොහොසත් වනනේ නම්, සංස්ථාව සහ තෝරාගත් ලංසුකරු අතර ඇති ගිවිසුම අවලංගු කිරීමට සංස්ථාවට පූර්ණ බලය පවතී. එසේ ගිවිසුම අවසන් කිරීමට සංස්ථාව තීරණය කළහොත්, ඉන් අනතුරුව වහාම ව්‍යාපාරික ස්ථානය නිසි පරිදි නැවත සංස්ථාවට භාරදීමට තෝරාගත් ලංසුකරු විසින් කටයුතු කළ යුතුය.

එවිට ආරක්ෂිත තැන්පත් මුදල තෝරාගත් ලංසුකරු වෙත නිදහස් කිරීමක් සිදු නොවන අතර, එය සංස්ථාව සතු වේ. වෙළඳ කුටියට අලාභයක් වී තිබේනම් එය සංස්ථාව විසින් තක්සේරු කර එම හානි මුදල සමඟ ඒ වන විට හිඟව ඇති සියළුම මුදල් තෝරාගත් ලංසුකරු විසින් සංස්ථාවට ගෙවිය යුතුය.

iv. 7.22 හි සඳහන් අවස්ථාවකදී පූර්ණ ආරක්ෂිත තැන්පතුව සංස්ථාව සතු වේ.

7.5 කිසියම් මාසයකට අදාළ **මාසික කුලී ගාස්තුව, නඩත්තු ගාස්තුව හා ඊට පෙර මාසයේ විදුලි හා ජල ගාස්තුව අදාල මාසයට පෙර මාසයේ 25 වන දිනට ප්‍රථම තෝරාගත් ලංසුකරු විසින් සංස්ථාවට ගෙවිය යුතුය.**

7.6 7.5 හි සඳහන් ගෙවීම් කළයුතු නියමිත දින සිට දින 07 ක් ඇතුලත මාසික කුලී හා අදාල ගාස්තු ගෙවීමට තෝරාගත් ලංසුකරු අපොහොසත් වන්නේ නම් විදුලිය හා ජල සැපයුම් විසන්ධි කිරීමට සංස්ථාව සතුව පූර්ණ බලය පවතින්නේය.

7.7 මාසික ගාස්තුව අදාළ දිනයට ගෙවීමට අපොහොසත් වන්නේ නම්, ප්‍රමාද වන දිනකට මාසික ගාස්තුවෙන් 0.067% ක ප්‍රමාණයක් ප්‍රමාද ගාස්තුව වශයෙන් අය කරනු ලැබේ.

7.8 අගරු චෙක්පත් සඳහා රු.5,000.00 ක දඩ මුදලක් අය කරනු ලබන අතර, ඉන් පසුව සිදු කරන ගෙවීම් මුදලින් පමණක් ගෙවිය යුතු වේ.

7.9 ගිවිසුම අවලංගු වීමෙන් අනතුරුව, සියළුම ආකාර හිඟ මුදල් තෝරාගත් ලංසුකරු විසින් සංස්ථාව වෙත ගෙවීමට කටයුතු කළ යුතුය.

7.10 තෝරාගත් ලංසුකරු අදාල ආහාරපාන වෙළඳ කුටිය දිනපතා පෙ.ව.09.00 සිට ප.ව.11.00 දක්වා විවෘතව තැබිය යුතුය.

7.11 අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී සංස්ථා නිලධාරීන් විසින් වෙළඳ කුටියේ ආහාර වල ගුණාත්වය හා ප්‍රමිතිය පරීක්ෂා කරන අතර විකිණීම සඳහා ඇති සියළුම ආහාර පාන වර්ග ඉතා ඉහළ ගුණාත්වයකින් හා ප්‍රමිතියකින් යුක්ත විය යුතුය. තවද පරිභෝජනයට නුසුදුසු ආහාර ද්‍රව්‍ය සහ අපද්‍රව්‍ය සංස්ථා නිලධාරීන් විසින් ලබාදෙන සුදුසු ස්ථානයක් තුල තෝරාගත් ලංසුකරු විසින් විනාශ කර දැමිය යුතුය

7.12 ආහාරපාන වෙළඳ කුටි පවත්වාගෙන යාමේදී මහජන සෞඛ්‍ය පරීක්ෂක නිළධාරීන් විසින් නියම කර ඇති කොන්දේසි හා නීති රීති වලට යටත්ව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වූ කරුණකි. තෝරාගත් ලංසුකරු 1980 අංක 26 දරණ ආහාර පනත ප්‍රකාරව 2012 ජනවාරි 26 දින අංක 1742/26 දරණ ගැසට් පත්‍රය හා 2019 ජුනි 17 දින අංක 2128/4 දරණ ගැසට් පත්‍රයට අනුව වෙළඳ කුටිය පවත්වා ගත යුතුය.

READ ONLY

7.13 අවස්ථානුකූලව මහජන සෞඛ්‍ය පරීක්ෂක නිළධාරීන් විසින් වෙළඳ කුටි පරීක්ෂා කිරීම සිදු කෙරේ. මෙම වෙළඳ කුටිය සඳහා ඊළඟ වසරේදී ගිවිසුම් දිගුව ලබා දීමේදී සිදු කරන කාර්යයසාධන ඇගයීම සඳහා ඔවුන් ලබාදෙන එම වාර්තාව සැළකිල්ලට ගනු ලැබේ.

7.14 අදාල ආහාරපාන කුටිය හෝ කොටසක් වෙනත් පාර්ශවයන් වෙත ව්‍යාපාර කටයුතු හෝ වෙනත් කටයුත්තකට ලබාදිමට තෝරාගත් ලංසුකරුට කිසිදු අයිතියක් නොමැත.

7.15 අදාල වෙළඳ කුටිය අවට පරිසරයට හා ස්ථානයට ගැලපෙන අයුරින් සංවර්ධනය කර ඇති බැවින්, සංස්ථාවේ අවසරයකින් තොරව කිසිදු වෙනසක් හෝ අලංකරණ කටයුත්තක් සිදුකිරීමට තෝරාගත් ලංසුකරුට කිසිදු අයිතියක් නොමැත.

එසේ වෙනසක් හෝ අලංකරණ කටයුත්තක් සිදුකිරීමට අවශ්‍ය වන්නේ නම්, ඊට ප්‍රථම එකී කටයුතු සවිස්තරව සංස්ථාව වෙත ඉදිරිපත් කොට නිසි අවසර ලබාගත යුතුය. තවද එකී සියළු අලංකරණ කටයුතු සඳහා පිරිවැය තෝරාගත් ලංසුකරු විසින් දැරිය යුතුය.

7.16 තෝරාගත් ලංසුකරු විසින් අවට පරිසරය හා වෙළඳපොල සෑම විටම ඉතා පිරිසිදුව හා ආකර්ෂණීයව පවත්වාගෙන යා යුතුය.

7.17 තෝරාගත් ලංසුකරු විසින් වෙළඳ කුටිය තුල හෝ ඒ අවට දුම්වැටි මත්පැන් හෝ වෙනත් මත්ද්‍රව්‍යය විකිණීම හෝ භාවිතය සපුරා තහනම් වේ.

7.18 තෝරාගත් ලංසුකරු විසින් ප්‍රචාරණය උදෙසා නාම පුවරු බැනර් යනාදිය වෙළඳ කුටිය තුල ප්‍රදර්ශනය කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඊට ප්‍රථම එකී සියළු ප්‍රචාරණ ක්‍රම සවිස්තරව සංස්ථාව වෙත ඉදිරිපත් කොට නිසි අවසර ලබාගත යුතුය. තවද එකී සියළු ප්‍රචාරණ කටයුතු සඳහා පිරිවැය ලංසුකරු විසින් දැරිය යුතුය.

7.19 තෝරාගත් ලංසුකරු විසින් කුටිය තුල භාවිතා කිරීමට අපේක්ෂිත උපාංග සහ අනෙකුත් උපකරණ ලැයිස්තුවක් ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම සංස්ථාව වෙත ඉදිරිපත් කළ යුතුය. එකී උපකරණ ආරක්ෂා කර ගැනීම තෝරාගත් ලංසුකරුගේ වගකීම වන අතර, එම භාණ්ඩ/උපකරණ සඳහා සිදුවන කිසිදු ආකාර අලාභයකදී/අස්ථානගතවීමකදී සංස්ථාව එම හානි පූර්ණය සඳහා කිසිඳු ආකාරයකින්වත් බැඳී නොසිටී.

7.20 වෙළඳ කුටියේ සේවයට යොදා ගන්නා සේවකයින් ගණන, ඔවුන්ගේ නම්, ජාතික හැඳුනුම්පත් අංක සහ අනෙකුත් විස්තර සහ රාජකාරී අවස්ථාවේදී භාවිතා කරන නිල ඇඳුමෙහි ඡායාරූපයක් තෝරාගත් ලංසුකරු විසින් සංස්ථාව වෙත ඉදිරිපත් කළ යුතුය.

7.21 සංස්ථාව විසින් තෝරාගත් ලංසුකරුගේ ව්‍යාපාර කටයුතු හා කාර්යසාධනය අඛණ්ඩව ඇගයීමකට ලක් කරනු ලැබේ. වසරකට පසුව තෝරාගත් ලංසුකරු සමඟ එළඹගත් ගිවිසුම අලුත් කිරීම හෝ අවලංගු කිරීමේ පූර්ණ බලය සංස්ථාව සතු වේ.

7.22 තෝරාගත් ලංසුකරුවන් විසින් නියමයන් සහ කොන්දේසි උල්ලංඝනය කළහොත් හෝ නීති විරෝධී කටයුතු සිදුකර ඇතැයි වාර්තා වුවහොත් සංස්ථාවට අවශ්‍ය නම් පරීක්ෂණයක් සිදු කර එහි ප්‍රතිඵලය මත පදනම්ව "ව්‍යාපාර ප්‍රදානය කිරීමේ ලිපිය" මඟින් ලබාදී ඇති අවසරය අත්හිටුවීමට සහ තෝරාගත් ලංසුකරු අතර ඇති කර ගත් ගිවිසුම අවලංගු කිරීමට අවශ්‍ය පූර්ණ බලය සංස්ථාව සතුවේ. එවැනි අවස්ථාවකදී, තෝරාගත් ලංසුකරු විසින් තැන්පත් කරන ලද ආරක්ෂිත තැන්පතුව සංස්ථාව සතු කර ගැනීමට සංස්ථාවට පූර්ණ බලය පවති. එනමුත්, ඒ වන විට සංස්ථාවට ගෙවීමට ඇති මුළු මුදල ආරක්ෂිත තැන්පතු මුදලට වඩා වැඩිවේ නම්, එම ඉක්මවන මුදල තෝරාගත් ලංසුකරු විසින් සංස්ථාවට ගෙවිය යුතුය.

7.23 සංස්ථාව විසින් අවසර ලබාදෙන දියත උයන පරිශ්‍රයේ පැවැත්වෙන දින 03 හෝ ඊට අඩු කාලයක් තුළ පැවැත්වෙන වැඩසටහන් වලදී, මෙහි දක්වා ඇති ආහාරපාන වර්ග අලෙවිය සිදු කිරීමට ඕනෑම අනෙකුත් පාර්ශවයන්ට ද හැකියාව පවතී.

7.24 දියත උයන පරිශ්‍රයේ ආහාරපාන සංකීර්ණය අසළ පිහිටි වාහන නැවතුම් අංගනය පිහිටි ප්‍රදේශය, වෙළඳ කුටි ආශ්‍රිත ප්‍රදේශය, ප්‍රදර්ශන මත්ස්‍ය ටැංකි ආශ්‍රිත ප්‍රදේශය හැර අනෙකුත් ඕනෑම ස්ථානයක, ආහාරපාන වෙළඳ කුටි සංකීර්ණයේ අලෙවිය සඳහා අවසර ලබාදී ඇති ආහාරපාන හෝ වෙනත් අමතර ආහාරපාන අලෙවි කරන වෙළඳ කුටියක් හෝ ජංගම ආහාරපාන රථයක් ස්ථානගත කිරීමට සංස්ථාවට පූර්ණ බලය පවතී.

DRAFT ONLY

**ප්‍රමාණ බිල්පත**

**දියත උයන පරිශ්‍රයේ ආහාරපාන වෙළඳ කුටි මාසික කුලී පදනම මත පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම**

වෙළඳ කුටි අංකය : අංක 12

වෙළඳ කුටියේ නාමය : South Indian & Vegetarian Food Corner

| අයිතම අංකය | විස්තරය | මාසික කුලිය (රු) (VAT රහිත) | වාර්ෂික වටිනාකම (රු) (VAT රහිත) |
|---|---|---|---|
| 01 | දියත උයන පරිශ්‍රයේ ආහාරපාන වෙළඳ කුටි අංක 12 මාසික කුලී පදනම මත පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම | (a) | (b) |
| | **එකතු** VAT 18% | | |
| | **මුළු එකතුව** | | |

මාසික කුලිය සඳහා (a) හි සඳහන් අගය **අකුරින්**

.......................................................................................................... + VAT

වාර්ෂික වටිනාකම සඳහා (b) හි සඳහන් අගය **අකුරින්**

............................................................................................................ + VAT

---

**සටහන්**

- අවම මාසික කුලිය

| වෙළඳ කුටි අංකය | වෙළඳ කුටියේ නාමය | අවම මාසික කුලිය (බදු නොමැතිව) (රු.) |
|---|---|---|
| 12 | South Indian & Vegetarian Food Corner | 206,500.00 |

- තෝරාගත් ලංසුකරු විසින් මාසික කුලියට අමතරව රු.50,000.00 ක් නඩත්තු ගාස්තු ගෙවිය යුතුය.
- තෝරාගත් ලංසුකරු විසින් විදුලි හා ජල බිල්පත් ගෙවිය යුතුය.

ලංසුකරුගේ අත්සන :- ..................................................

නම :- ..................................................

ජා. හැ. අංකය :- ..................................................

ලිපිනය :- ..................................................

දුරකථන අංකය :- ..................................................

(Whatsapp පහසුකම සහිත)

ඊමේල් ලිපිනය :- ..................................................

සාක්ෂි 01 අත්සන :- ..................................................

නම :- ..................................................

ජා. හැ. අංකය :- ..................................................

ලිපිනය :- ..................................................

සාක්ෂි 02 අත්සන :- ..................................................

නම :- ..................................................

ජා. හැ. අංකය :- ..................................................

ලිපිනය :- ..................................................



READ ONLY

### දුස්සන්ධාන ගත නොවූ බවට වන දිවුරුම් ප්‍රකාශය (ආකෘතිය)
### (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමුව -1.5)

..............................යන ලිපිනයේ ලියාපදිංචි ව්‍යාපාරික ස්ථානය පිහිටි සහ .............. ලියාපදිංචි අංක දරණ ............................ තනි පුද්ගල ව්‍යාපාරයෙහි/සමාගමෙහි ............................ වන මා (ජා.හැ අංක .................... දරණ) පහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බවට අවංකව හා ගාම්භීරතා පූර්වකව ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටියි.

01. ඔහු/ඇය නියෝජනය කරන ආයතනයේ, සමාගමේ, සංස්ථාවේ හෝ හවුල් ව්‍යාපාරයේ වෙනත් යම් සාමාජිකයකු, නියෝජිතයකු හෝ ඒජන්තවරයකු විසින්, ඔහු/ඇය, ලංසු තැබීමට නියමිත මිල සම්බන්ධයෙන් යම් පුද්ගලයකු සමග කිසියම් සංයෝජනයකට, හවුලකට හෝ ඒ හා සමාන ගිවිසුමකට එළඹ නොමැති බවත්,

02. ඔහු/ඇය හෝ ඔහු/ඇය නියෝජනය කරන යම් තැනැත්තකු විසින් යම් ලංසුකරුවකු ලංසු තැබීමෙන් වැළැක්වීමට හෝ ලංසු තැබීමෙන් වැළකී සිටීමට කිසිවකු පොළඹවා ගැනීමට කිසිදු පියවරක් ගෙන නොමැති බවත්; සහ

03. මෙම ලංසුව, වෙනත් කිසිදු ලංසුවක තොරතුරු විමසීමෙන් තොරව සකසා ඇති බවත්, මෙම ලංසුව සම්බන්ධයෙන් වෙනත් යම් තැනැත්තකු සමග යම් ගිවිසුමකට, එකගතාවයකට හෝ යම් සංයෝජනයකට එළඹ නොමැති බවත්;

04. මෙම ලංසුව ඉදිරිපත් කිරීමට අදාළව කිසිදු පුද්ගලයකුට, සමාගමකට හෝ සංස්ථාවකට සෘජුව හෝ වක්‍රව කිසිදු වට්ටමක්, ගාස්තුවක්, ත්‍යාගයක්, කොමිස් මුදලක් හෝ වෙනත් වටිනා ද්‍රව්‍යයක් ලැබී නොමැති බවත් එවැන්නක් නොලැබෙන බවත් ඔහු/ඇය වැඩි දුරටත් ප්‍රකාශ කර සිටී.

05. වෙනත් එවැනි ගිවිසුමකට එළඹ නොමැති බවට ලංසුකරු වගකීම් සහගතව ප්‍රකාශ කර සිටින අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය පුරාවට සාධාරණ හා සදාචාරාත්මක තරග පිළිවෙත් වලට අනුගත වන බවටත් අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට පූර්ණ වශයෙන් අනුකූල වන බවටත් මෙයින් ප්‍රතිඥා දෙයි.

මෙම දිවුරුම් ප්‍රකාශයේ මා විසින් ඉදිරිපත් කර ඇති සියලු ම ප්‍රකාශ සත්‍ය හා නිවැරදි බවත්, බොරු සාක්ෂි දීමෙන් ඇති විය හැකි ප්‍රතිඵල පිළිබඳව දැනුවත් බවත් මම මෙයින් සහතික කරමි.

ඉහත සඳහන් දිවුරුම් ප්‍රකාශය එකී ප්‍රකාශක හට

මා විසින් කියවා පැහැදිලි කර දුන් බවත් ඔහු/ඇය

එහි සඳහන් කරුණු අවබෝධ කර ගත් බවත්

එකී කරුණු නිවැරදි බවට පිළිගෙන.....................

දින ..........මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් ප්‍රකාශ කරමි.

මා ඉදිරිපිට දී ය.

සාමදාන විනිශ්චයකාර/දිවුරුම් කොමසාරිස්

# Non-collusion Affidavit

The undersigned bidder or agent, hereby solemnly, sincerely, and truly declares and affirms/makes an oath and states as follows;

a.) That he/she has not, nor has any other member, representative, or agent of the firm, company, corporation, or partnership representing him/her, entered into any combination, collusion, or similar agreement with any person in connection with the price to be bid;

b.) That he/she or anyone representing him/her has not taken any step whatsoever to prevent any person from bidding, nor to induce anyone to refrain from bidding; and

c.) That this bid is made without reference to any other bid and without any agreement, understanding, or combination with any other person in reference to this bid.

He/she further states that no person, firm, or corporation has received or will receive, directly or indirectly, any rebate, fee, gift, commission, or thing of value in connection with the submission of this bid.

The bidder accepts full responsibility for ensuring the absence of collusion and hereby pledges to abide by fair and ethical competition practices throughout the procurement process and fully comply with the applicable Procurement Guidelines.

I hereby affirm, under the penalties for perjury, that all statements made by me in this affidavit are true and correct.

The foregoing Affidavit having been
duly read over and explained by me to
the Affirmant above named and he/she
having understood the contents therein
and admitted to be correct, affirmed and
set his/her signature hereto before me)
on this …. day of … at …

BEFORE ME,
JUSTICE OF THE PEACE/COMMISSIONER OF OATHS

**Annexure 2**

# SPECIMEN FORM OF BID SECURITY

…………………………………..
…………………………………..
…………………………………..
(Name & Address of Guarantor)

**Beneficiary;**
General Manager,
Sri Lanka Land Development Corporation,
No 03,
Sri Jayawardenapura Mawatha,
Rajagiriya.

Whereas, ............................................................... (name of tenderer) (hereinafter called and referred to as " the Tenderer "), has submitted its Tender dated ...................... (date) for the "Renting of Food stall No…… at "Diyatha Uyana" (hereinafter called and referred to as " the Tender").KNOW ALL PEOPLE by these presents that WE................................................... (name of organization) having our registered office at ............................................ (hereinafter called and referred to as "the Guarantor"), are bound unto "General Manager, Sri Lanka Land Development Corporation, No 03, Sri Jayawardenapura Mawatha, Rajagiriya" (hereinafter called and referred to "the Employer") in the sum of Sri Lanka Rupees 100,000.00 for which payment well and truly to be made to the said Employer. The Guarantor binds itself, its successors, and assignees by these presents.
SEALED with the Common Seal of the said Guarantor this ........................... day of ............................
We undertake to pay the Employer unconditionally up to the above amount upon receipt of its first written demand, without the Employer having to substantiate its demand provided that in its demand the Employer will note that the amount claimed by it is due to it, specifying the occurred condition or conditions.

This Guarantee will remain in force up to …………………. and any demand in respect thereof shall be received by us no later than the above date.

READ ONLY

DATE ................................
SIGNATUREOFTHEGUARANTOR..........................................

WITNESS............................. SEAL
.................................................
(Signature, Name and Address)